# අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

## සබරගමුව පළාත් සභාව

## විදුහල්පති තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම

පහත සඳහන් කොන්දේසි වලට අදාළ ව දැනට පුරප්පාඩු පවතින පාසල් වල (අමුණා ඇත) විදුහල්පති තනතුර සඳහා අයදුම්පත් කැඳවීමට අදාළ තොරතුරු පහත සඳහන් පරිදි වේ.

02. ඒ අනුව දැනට පුරප්පාඩු වී ඇති ඇමුණුමේ සඳහන් තනතුර සඳහා සුදුසුකම්ලත් සබරගමුව පළාතේ දැනට සේවයේ නියුතු, **2022.12.31** දිනට වයස අවුරුදු **57**ට අඩු ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I වන පන්තියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**1** වන ශ්‍රේණියේ අයදුම්පත් ප්‍රමාණවත් තරම් ඉදිරිපත් කර නොමැති වුවහොත් පමණක් ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ **2** හා **3** වන පන්තියේ නිලධාරීන් ද සම්මුඛ පරීක්ෂණයට කැඳවා සුදුසුකම් පරීක්ෂා කර පත්වීම් ලබාදීම අපේක්ෂා කරන බැවින්,**2** හා **3** වන පන්තියේ නිලධාරීන්ට ද මේ සඳහා අයදුම්පත්‍ර ඉදිරිපත් කළ හැකිය.එසේ වුවද **(1** හෝ **2** පන්තියේ නිලධාරීන්ගෙන් ප්‍රමාණවත් තරම් අයදුම්පත්‍ර ඉදිරිපත් වී ඇත්නම් **3** පන්තියේ නිළධාරීන්ගේ අයදුම්පත්‍ර සළකා බලනු නොලැබේ.**)**

03.අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ ජීව දත්ත තොරතුරු සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර දැනට සේවය කරන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය සහිතව **2022.12.10** දිනට පෙර ලේකම් අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, සබරගමුව පළාත් සභාව, නව නගරය, රත්නපුර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.අයදුම්පත්‍ර බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි,ඉල්ලුම් කරන විද්‍යාලයේ නම හා තනතුර සඳහන් කළ යුතුය.

04. අයදුම්පත්‍ර ලැබීමෙන් පසුව පැවැත්වෙන විධිමත් සම්මුඛ පරීක්ෂණයකින් ලකුණු ලබා දීමෙන් අනතුරුව සුදුසු අය තෝරා පත් කර ගැනීමට කටයුතු කරනු ලැබේ.අදාළ අයදුම්පත්‍රය සහ ලකුණු ලබාදීම පිළිබඳ විස්තර www.moe.sg.gov.lk වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.

සුජානි ආර්. විජේතුංග
ලේකම්
අධ්‍යාපන තොරතුරු තාක්ෂණ සහ
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව
නව නගරය රත්නපුර

සුජානි ආර්.විජේතුංග,
ලේකම්,
අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
සබරගමුව පළාත් සභාව.

2022/11/23